# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. : MFE/DEV/IR-04/27
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2023.04. 24

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: 01/2023

**රැකියා සඳහා විදෙස්ගතව සිට නැවත මෙරටට පැමිණෙන විගමනික ශ්‍රමිකයින් සඳහා අතිරේක තීරු බදු සහන ලබා දීම**

විගමනික ශ්‍රමිකයින් එතෙර රැකියා නියුක්තිය තුළින් උපයන ලද විදේශ විනිමය නීත්‍යානුකූල මාර්ග ඔස්සේ මෙරටට ප්‍රේෂණය කිරීම දිරිගැන්වීම පිණිස, ඔවුන් නැවත මෙරටට පැමිණෙන අවස්ථාවන්හිදී, ගුවන්තොටුපල තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා විදේශගත වී සිටි කාලසීමාව පදනම් කරගෙන දැනට දෙනු ලබන තීරු බදු දීමනාවට අමතරව ඔවුන් එවන විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබාදීමට 2022.08.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක කිරීම පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

**02. කොන්දේසි/ නිර්නායක**

2.1 මෙම අතිරේක තීරු බදු සහනය ලබාදීම සඳහා සලකා බලනුයේ එතෙර සේවා නියුක්තියෙන් උපයා මෙරට බැංකු පද්ධතිය හරහා ප්‍රතිලාභියාගේ ඒක පුද්ගල හෝ බද්ධ රුපියල් ගිණුමකට පමණක් ප්‍රේෂණය කරන ලද විදේශ මුදල් ප්‍රමාණය වේ. ඒ අනුව, අදාල වාණිජ බැංකුව විසින් මෙහි 3.1හි සඳහන් යෙදවුමට අදාල දත්ත පද්ධතියට ලබාදෙනුයේ ප්‍රතිලාභියාගේ ප්‍රේෂණවල රුපියල් අගය වේ. ඉන්පසුව යෙදවුම හරහා එම රුපියල් අගය ඩොලර් සමානුපාතිකයක් ලෙස වාර්තා කෙරෙන අතර එහිදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල දිනය සඳහා ප්‍රකාශ කරන ලද මධ්‍ය විනිමය අනුපාතිකය (TT Middle Exchange Rate) භාවිතා කර එ.ජ.ඩොලර් වලට පරිවර්තනය කරනු ඇත. කෙසේවෙතත් මෙම සහනය ලබාදීම පිණිස ශ්‍රමිකයා විසින් විදේශ මුදල් ගිණුමකට හෝ කවුන්ටරයෙන් මුදල් ලෙස ලබාගැනීම සඳහා හෝ එවන ලද ප්‍රේෂණ සලකා බලනු නොලැබේ.

2.2 මෙම අතිරේක තීරු බදු සහනය ලැබීමට 2022.05.01 දිනෙන් පසුව එවන ලද ප්‍රේෂණ ප්‍රමාණය සලකා බලනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් වරක් තීරු බදු සහනය ලබාගත් ශ්‍රමිකයෙකුට නැවත වරක් එම සහනය ලබාගත හැකි වනුයේ මාස 12 ක සීමාවකින් පසුවයි. ඒ අනුව මෙම අතිරේක තීරු බදු සහනය ලබාගැනීමට අදාලව මුල් වරට කරනු ලබන ඉල්ලීමක් සඳහා 2022.05.01 දිනෙන් පසුව ඉල්ලීම් කරන දිනය දක්වා රුපියල් ගිණුම් වලට එවා තිබෙන ප්‍රේෂණ ප්‍රමාණය ආසන්න එක් වසරක උපරිමයකට යටත්ව සැලකිල්ලට ගනු ලැබේ.